# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## 2026 වසර සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2026 වසර සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට භාණ්ඩ /සේවා සැපයීම හා ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂාකරන සැපයුම් කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන් / දේශීය නියෝජිතයන්ගෙන් / බෙදාහරින්නන්ගෙන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ආදර්ශ අයදුම්පත් හා ආශ්‍රිත විස්තර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය ඔස්සේ බාගත කළ හැකිය. "www.sjp.ac.lk - Procurement and Notices"
2. එක් එක් භාණ්ඩ / සේවා / ඉදිකිරීම් උප කාණ්ඩ/ උප-අනු කාණ්ඩ සඳහා වෙන් වශයෙන් ආපසු නොගෙවන රු.2,000.00 ක තැන්පතු මුදලක් බැගින් ලියාපදිංචි ගාස්තු ලෙස ගෙවිය යුතුයි.
3. **එම ලියාපදිංචි ගාස්තුව මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවේ අංක 097-1-001-6-2315454 දරණ ගිණුමට ගෙවීම් සිදුකර එම රිසිට් පත අයදුම්පත් සමග අමුණා එවිය යුතුය. මුදල් අණකර (Money Order), බැංකු අණකර (Bank Draft) හෝ චෙක්පත් භාරනොගන්නා බව කරුණාවෙන් සලකන්න.**
4. **ලියාපදිංචි ගාස්තු ගෙවීම් govpay හරහා සිදුකල හැකි අතර එලෙස ගෙවීම් සිදු කිරීමේ දී ඔබගේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය යොමු අංකය ලෙස ඇතුළත් කළ යුතුවේ.**
5. භාණ්ඩ/සේවා/ ඉදිකිරීම් උප කාණ්ඩ/උප- අනු කාණ්ඩ සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත්, මුදල් ගෙවූ රිසිට් පත්, සහ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.

   i. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ක්ෂේත්‍රවලට අදාළ අනෙකුත් බලපත්‍ර, සමාගම් සඳහා සංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය.
   ii. මේ සමග ඉදිරිපත් කර ඇති Conflict of Interest පෝරමය
   iii. අදාළ ක්ෂේත්‍රවල අවු. 03 ක පළපුරුද්ද (සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන සමග)
   iv. වලංගු VAT සහතිකයක පිටපතක්

6. සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් ලියාපදිංචි නොකරන අතර තැන්පතු ආපසු නොගෙවන බව කරුණාවෙන් සලකන්න. රජයේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ඉහත ලිපි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.
7. අයදුම්පත් **නියෝජ්‍ය මුල්‍යාධිකාරී, සැපයුම් අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (පරිපාලන සංකීර්ණය) ප්‍රධාන සැපයුම් අංශයෙහි ස්ථාපිත කර ඇති බහාලුමට **2025.12.29** වැනි දිනට හෝ ඊට පෙර ගෙනවිත් බහාලීම කළහැකිය.
8. මුදල් ගෙවූ රිසිට්පත් ඊට අදාළ සැකසූ අයදුම්පත සමග ලියුම් කවරයක බහා ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම (උප කාණ්ඩයේ /උප- අනු කාණ්ඩයේ නම, අංකය) -2026"** ලෙස සඳහන් කර එවිය යුතුය.
9. ඕනෑම අයදුම්පත්‍රයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. කිසියම් සැපයුම්කරුවෙකු මිල කැඳවීමකට අනුව නියමිත පිරිවිතරයන්ට අනුව නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබාදීමට අසමත් වුවහොත් කලින් දැනුම් දීමකින් තොරව ලියාපදිංචිය අත්හිටුවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.
10. ඇගයීම් මණ්ඩලයක් විසින් සිදුකරන ඇගයීමෙන් අනතුරුව අසම්පූර්ණ අයදුම්පත් හා පෙර වර්ෂවලදී නියමිත පිරිවිතරයන්ට සහ නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබාදීමට අසමත් වූ සැපයුම්කරුවන්ගේ අයදුම්පත් ලියාපදිංචියෙන් ඉවත් කරනු ලැබේ.
11. පෙර වසර සඳහා ලියාපදිංචි ව සිටින සැපයුම්කරුන්ගෙන් තුන් වරක් අඛණ්ඩව මිල කැඳවීම් සඳහා ප්‍රතිචාර නොදක්වා තිබේ නම් හෝ කලින් පැවති ගනුදෙනුවක් සාර්ථකව නිම කර නොමැති නම්, එම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් ඉවත් කරනු ලැබේ.
12. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් ලබාගන්නා අතර තරඟකාරී මිල ගණන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.
13. ලියාපදිංචිවන සියලුම සැපයුම් හා කොන්ත්‍රාත් දින 30 ක අවම ණය කාලසීමාවකට යටත් විය යුතුය.
14. ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය තොරතුරු පහත සඳහන් දුරකථන අංක හෝ ඊ-මේල් මගින් ලබා ගත හැකිය.
    දුරකථන අංක: 0112758216, 0112758217, ඊ-මේල්: suppliersregistration@sjp.ac.lk
15. එමෙන්ම, 2026 වසර සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා E-Procurement ක්‍රමය යටතේ promise.lk වෙබ් අඩවිය හරහා මිල කැඳවුම් සිදු කරන බවද දැනුම් දෙමි.

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ
2025.12.02